ලංකාපුර ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 28 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් ද උපචිත පදනම මත ගිණුම්ගත කර තිබුණු නමුත් සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කිරීමේදී, මුද්දර ගාස්තු හා උසාවි දඩ, මුදල් පදනම මත ගිණුම්ගත කරන බව දක්වා තිබුණි. | උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුවේ. | එකඟ වෙමි. 2020 වර්ෂයේදී සංශෝධනය කිරීමට කටයුතු කරමි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාලව හඳුනාගෙන තිබුණු උසාවි දඩ ආදායම රු.5,401,974 ක්, මූල්‍ය ප්‍රකාශනවල රු.2,425,833 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | යාවත්කාලීන තොරතුරු ලබාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. තොරතුරු ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් නිවැරදි අගය ගිණුම්ගත කළ නොහැකි වන බව සඳහන් කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයටම අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හා දෙසැම්බර් මාසයට අදාල ලැබිය යුතු උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | යාවත්කාලීන තොරතුරු ලබාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | එකඟ වෙමි. අදාල තොරතුරු ලබාදී නොමැති නිසා ගිණුම්ගත කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාලව රු.344,843 ක් වූ වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුවේ. | එකඟ වෙමි. ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

**(ඇ)** **නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් වල එකතුව සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රුපියල් 10,724,385 ක වෙනසක් විය. | වෙනස සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කරමි. |

**1.4** **අනුකූල නොවීම**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මු.රෙ.396 | 340,995 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ කාලය මාස හයක් ඉක්ම වූ චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු කර ඇත. |

**1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපළ හා උපකරණ බදුදීම තුළින් ලැබිය යුතු රු.2,725,586 ක් අතරින් රු.1,914,730 ක් වර්ෂ පහකට අධික කාලයක් තිස්සේ අය නොවූ ශේෂයන් විය. | හිඟ ආදායම් අයකරගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර ඇති විවිධ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් රු.28,152,037 ක් ලැබිය යුතු වූ අතර රු.29,931,394 ක් ගෙවිය යුතුව තිබුණි. | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබිය යුතු හා ගෙවියයුතු ශේෂ නිරවුල් කරමින් පවතී. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,594,162 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.5,134,193 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ 31 . දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ 31 . දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 70,000 | 30,000 | 30,000 | | 70,000 | 81,750 | 81,750 | |
| කුලී | 9,296,114 | 8,935,208 | 9,049,549 | 2,017,329 | 6,955,286 | 9,771,470 | 9,602,530 | 2,232,265 |
| බලපත්‍ර ගාස්තු | 1,040,750 | 1,530,804 | 1,530,804 | | 1,307,000 | 1,959,890 | 1,959,890 | |
| වෙනත් ආදායම් | 7,680,913 | 11,137,354 | 12,017,342 | 1,613,287 | 9,984,470 | 9,157,474 | 5,828,664 | 4,514,522 |
| එකතුව | 18,087,777 | 21,633,366 | 22,627,695 | 3,630,616 | 18,316,756 | 20,970,584 | 17,472,834 | 6,746,787 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 ඔක්තෝබර් 31 දින තල්පොත නගරය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ගැසට් කර, 2013 නොවැම්බර් 28 වරිපනම් අයකර ගැනීමට සභා සම්මත කර 2014 අගෝස්තු 29 දින විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ද ලබා දී තිබුණි. එහෙත් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් දේපල තක්සේරු කරවා ගැනීමට සභාව අපොහොසත්වී තිබූ නිසා වසර 07 කට අධික කාලයක් සභාවට රැස්කරගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | දේපල තක්සේරු කරගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | වරිපනම් අයකිරීමට අදාල දේපල තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ලෙස හඳුනාගත් උසාවි දඩ මුදල රු.6,078,823 ක් විය. | ලැබිය යුතු ආදායම් යාවත්කාලීනව අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කාලානුරූපීව සංවර්ධන කටයුතු සඳහා ලබාගන්නා බව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවලට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු රු.351,528 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට අදාලව කිසිදු ආදායමක් හඳුනාගෙන නොතිබුණි. | තොරතුරු යාවත්කාලීනව ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | වගකිව යුතු ආයතන විසින් තොරතුරු ලබාදී නොමැත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වර්ගීකරණයකින් තොරව කසළ රැස්කිරීම දක්නට ලැබුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව කළ යුතුවේ. | කසළ වර්ගීකරණය කර ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලේකම් තනතුර පුරප්පාඩුව පැවතීම නිසා වැඩබැලීම සඳහා නිලධාරිනියක පත්කර තිබුණි. ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකුගේ හා පුස්තකාලාධිපති තනතුරු 03 ක පුරප්පාඩු පැවති අතර, වෙනත් තනතුරුවල පුරප්පාඩු 10 ක් පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | එකඟ වෙමි. අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස අදාල බලධාරීන් දැනුවත් කර ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු.30,225,118 ක් වූ ගොඩනැගිලි වාහන හා යන්ත්‍රෝපකරණ 10 ක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | නිෂ්ක්‍රීය වත්කම් ප්‍රායෝජනයට ගත යුතුවේ. | ගම් සභා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමටත්, 2018 සමීකෂණයෙන් වෙන්දේසි කර ඉතිරි වූ අනෙකුත් භාණ්ඩ නැවත වෙන්දේසියටත්, බස් නැවතුම්පොළ, කුබෝටා අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය ප්‍රයෝජනයට ගැනීමටත් අවශ්‍ය සැලසුම් කර ඇත. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
---------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී නිලධාරියකු පත් කර අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් ද සකස් කර තිබුණ නමුත් අදාළ නිලධාරිනිය වෙත අනෙකුත් රාජකාරි පවරා තිබීම හා නිසි පුහුණුවක් නොතිබීම හේතුවෙන් නිසි පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කළ යුතවේ. | කාර්ය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් වෙනත් රාජකාරි කරන නිලධාරියෙකු පත්කළ අතර විෂය පිළිබඳ පුහුණුවක් ලබාදීමට සැලසුම් කර ඇති බව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. |